**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම -2019**
**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 33 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේදී ස්ථාවර තැන්පතු මත සමාලෝචිත වර්ෂයේදී ලද රු. 40,752,458 ක පොළී ආදායම ආයෝජන ක්‍රියාකාරකම්වලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවද එම මුදල මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | එකඟ වේ.<br>මෙය 2020 වසරේ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඇතුලත් කර ඇත . | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කළමනාකරණය කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් යටතේ දැක්වෙන ධාරණ අගය රු.619,031 ක් වූ ස්ථාවර වත්කම්, රු.12,430,943 ක් වූ තොග සහ අත ඉතිරි මුදල් රු.173,727 ක් භෞතිකව නොපැවතුණි. රු.13,223,704 ක් වූ මෙම පාඩු සඳහා ප්‍රතිපාදනයන් ද මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නෙතිබුණු නිසා වාර්ෂික හෝ සමුච්චිත පාඩුව එම ප්‍රමාණයෙන් වැඩි විය යුතු බව නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රකාශනවල පවත්නා වත්කම් භෞතිකව නොපැවතීමට හේතු සහ ඊට වගකිවයුතු පුද්ගලයින් නිශ්චය කිරීමට පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද, වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබු බවද නිරීක්ෂණය විය. | ආයතනය සතුව භෞතිකව මෙම තොග දැනට නොපවතී. ඉදිරියේදී මෙම තොග සඳහා හානිකරණ වෙන්කිරීමක් සිදුකිරීමට කටයුතු කරනු ඇත .<br>සමාගම සම්බන්ධයෙන් අය විය යුතු සියළුම මුදල් අයකරගැනීම සඳහා කළමණාකරනය විසින් කටයුතු කරනු ඇත .<br>සුළු මුදල් ශේෂය භෞතිකව නොපවතී. | කළමනකරණය විසින් වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු පියවර ගතයුතු අතර වත්කම් හානිවීම් සම්බන්ධයෙන් වගකීමටද බැදේ. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු.2,999,501,623 ක් වූ අතර එදිනට සමාගමේ ශුද්ධ වත්කම් රු. 2,924,501,625 ක ඍණ අගයක් නිරූපණය විය. සමාගමේ මෙහෙයුම් කටයුතු ද 2017 නොවැම්බර් 13 දින සිට නතර කර තිබුණු අතර 2018 පෙබරවාරි 15 දින සමාගම ඇවර කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කර තිබුණද, 2021 මාර්තු 15 දින දක්වාම ඇවරකරුවෙකු පත්කර නොතිබුණි. | මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම කැබිනට් අනුමැතියක් යටතේ පිහිටුවා ඇති බැවින් එය විසුරුවා හැරීම සඳහා ද කැබිනට් අනුමැතියක් ලබා ගතයුතු බව සමාගම විසින් තීරණය කරන ලදී .<br>එබැවින් ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාව සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය වල පිටපත් දැනටමත් අමාත්‍යාංශ ලේකම්තුමා වෙතට භාර දී ඇත. කැබිනට් අනුමැතිය ලැබුණු පසු අවශ්‍යය අනෙකුත් පියවර කඩිනමින් ගනු ඇත . | සමාගම ඇවර කිරීමට තීරණය කර ඇති බැවින් එය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු නිලධාරීන් ක්‍රියාකල යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| හැටන් නැෂනල් බැංකු ණය ශේෂය | රු. 4,190,556,780 | ශේෂ සනාථන ලිපි | පිලිතුරු ඉදිරිපත්කර නොමැත. | බැංකුව සමඟ සාකච්ඡාකර ගැටලු විසඳා ගැනීමට කටයුතු කල යුතුය. |
| රජයෙන් ලැබිය යුතු ශේෂය | රු. 17,782,563 | මූලාශ්‍ර ලේඛන, | පිලිතුරු ඉදිරිපත්කර නොමැත. | විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |
| නැව්තෙල් රක්ෂණය වෙනුවෙන් ලැබිය යුතු ශේෂය | රු. 28,040,453 | ශේෂ සනාථන ලිපි, වයස් විශ්ලේෂණ වාර්තා සහ උපකාරක ලියවිලි | පිලිතුරු ඉදිරිපත්කර නොමැත. | විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතුකල යුතුය. |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය | රු. 3,589,879 | | පිලිතුරු ඉදිරිපත්කර නොමැත. | විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතුකල යුතුය. |
| ගෙවිය යුතු අනිකුත් දෑ වලට අදාළ ශේෂය | රු. 15,591,171 | | පිලිතුරු ඉදිරිපත්කර නොමැත. | විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතුකල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| බැංකු මුදලින් ගෙවීම් | රු.**34,518,489** | ගෙවීම් වවුචර්පත් සහ උපකාරක ලියවිලි | **2018** වර්ෂයේ ලියවිලි හැකි ඉක්මණින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම **2018** වර්ෂයේ ලියවිලි ස්ථාන මාරු කිරීමකදී අස්ථාන ගතවී ඇති බව උපකල්පනය කෙරේ. කෙසේ වුවද එම ලිය කියවිලි සොයා බලා ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන අතර බැංකුව වෙතින් එම ගෙවීම් වලට අදාළ චෙක්පත්වල පිටපත් ලබා ගැනීමට ලිඛිතව සන්නිවේදනය කරන ලදී. | අදාල ගෙවීම් වවුචර්පත් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතුකල යුතුය. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම

**1.6.1** ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2019** වර්ෂය සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව **2019** දෙසැම්බර් **31** දිනට සම්බන්ධිත පාර්ශවය වන ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු. **103,666,952** ක් දක්වා තිබුණ ද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට සමාගමට ගෙවිය යුතු ශේෂය රු. **98,938,252** ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාගමට ලැබිය යුතු ශේෂයේ රු.**4,728,700** ක වෙනසක් නිරීක්‍ෂණය විය. මෙම වෙනස්කම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ නොතිබුණි. ඉහත ශේෂය තුල අන්තර්ගත **2017** වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අයකරගත යුතු වූ ටග් යාත්‍රා සඳහා වන්දි මුදල් රු.**25,719,981** ක්, කළමනාකරණ සේවා ගාස්තු රු.**76,547,854** ක් හා කළමනාකරණ සමාගම් පරිශ්‍රයේ පිහිටි ඉන්ධන පිරවුම්හලෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් වාහන සඳහා නිකුත් කර තිබූ ඩීසල් හා පෙට්‍රල් ලීටර් **11,449** ක් සඳහා වූ රු. **1,399,115** ක් අන්තර්ගත වූ අතර **2021** ජනවාරි **15** තෙක් අදාල මුදල සමාගම වෙත ලැබී නොතිබුණි. තවද එම ලැබිය යුතු ශේෂය සඳහා ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිලිතුර ඉදිරිපත්කර නොමැත. | ශේෂ සනාථන ඉදිරිපත් නොකල ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් ඒවා ලැබීමට හෝ නොලැබීමට ඇති හැකියාව සොයා බලා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව හානිකරණ ප්‍රතිපාදන සිදු කිරීමට කළමනාකරණය ක්‍රියාකල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් **2014** වර්ෂයේදී නැව් තෙල් මිලදී ගැනීම සඳහා දේශීය පෞද්ගලික බැංකුවකින් රු.**3,144,178,059** කට සමාන එක්සත් ජනපද ඩොලර් **24,002,438** ක ණය මුදලක් ලබා ගෙන තිබූ අතර මූල්‍ය ප්‍රකාශ අනුව **2019** වර්ෂය සඳහා රු.**188,938,122** ක් වූ පොළී මුදල ද ඇතුලත්ව ගෙවිය යුතු මුළු පොළී මුදල රු. **770,994,463** ක් විය. ඒ අනුව **2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවිය යුතු ණය හා පොළී ශේෂය රු. **4,190,556,780** කට සමාන එ.ජ.ඩො. **23,071,433** ක් විය. මෙම ණය ශේෂය සම්බන්ධයෙන් සමාගම විසින් **2020** සැප්තැම්බර් **23** දින ශේෂය සනාථන කැඳවා තිබුණද අදාල බැංකුව විසින් ශේෂ සනාථන ලබා දී නොතිබුණි. ඒ හේතුවෙන් ඉහත ණය ශේෂයෙහි නිවැරදිතාවය පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැවතුණි. තවද සමාගම විසින් **2017** දී සහ එයින් පසු වර්ෂවලදී ණය හෝ පොළී මුදල් කිසිවක් ගෙවා නොතිබුණු අතර මෙම ණය මුදල ආපසු අයකර ගැනීම සඳහා අදාළ බැංකුව විසින් **2020** වර්ෂයේදී සමාගමට විරුද්ධව නඩුවක් ගොනුකර පවත්වාගෙන යන නමුත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ. සමාගමට විරුද්ධව අදාල බැංකුව විසින් **2020** වර්ෂයේදී සමාගමට විරුද්ධව ගොනු කර ඇති නඩුව පිළිබඳව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීමක් කරනු ඇත. | ගරු අධිකරණය ලබාදෙන නඩු තීන්දුව ප්‍රකාරව කටයුතුකල යුතු වීම. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ)**2003** ජුනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ **6.5.1** වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින **60** ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගමේ **2019** වර්ෂයේ ගිණුම් ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ **2021** ජනවාරි **06** දිනදීය. | නව සභාපතිතුමෙකු සහ කළමණාකාර අධ්‍යක්ෂකතුමෙකු ඇතුළු නව අධ්‍යක්ෂක මණ්ඩලයක් **2020** ජූලි මස සිට පත් කරන ලදී. එමෙන්ම අර්ධකාලීනව සේවයේ නියුතු මුදල් කළමණාකරුගේද සේවය **2019.12.31** දිනෙන් අවසන් වූ අතර නැවත පත්වීම **2020.08.13** දින සිට සිදු කරන ලදී . එම පත්වීම සිදුවූ පසු **2019** වසරේ ගිණුම් පිළියෙල කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නිසිලෙස ඉදිරිපත් කරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව මූල්‍ය වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) **2015 ජුනි 17** දිනැති අංක **පීඊඩී3/2015** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි **2.2** වගන්තිය | **(i)** | රජය සතු පරිපාලිත සමාගම්වල සභාපතිවරයා වෙත මාසික දීමනා ගෙවීමේදී රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නිර්දේශය සහ මුදල් අමාත්‍යතුමාගේ එකඟතාවය ලබා ගත යුතු වුවද වසා දැමීමට තීරණය කර ඇති සමාගම විසින් ඉහත පරිදි නිර්දේශ ලබා ගැනිමකින් තොරව සභාපතිවරයා වෙත මාසිකව රු **125,000.**ක් බැගින් **2019** **1,500,000.**වර්ෂය තුළ දී රුක් දීමනා ලෙස ගෙවා තිබුණි. | සභාපති වරයාගේ මාසික දීමනා සහ සමාගමේ අධ්‍යක්‍ෂක මණ්ඩල රැස්වීම් සඳහා දීමනා අධ්‍යකෂක මණ්ඩල අනුමැතිය සහිතව ගෙවා ඇත. | විධිමත් අනුමැතියකින් තොරව ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| | **(ii)** | මෙම චක්‍රලේඛය අනුව සමාගම එෆ් **(F)** වර්ගීකරණයට ඇතුලත් වන බැවින්, සමාගමේ පාලක මණ්ඩල රැස්වීම් දීමනා ගෙවීම සඳහා ද ඉහත **(i)** හි පරිදි නිර්දේශය හා එකඟතාවය ලබාගත යුතුවේ. තවද, චක්‍රලේඛය අනුව එහි සඳහන් ඒ **(A)** සිට ඊ **(E)** දක්වා වූ වර්ගීකරණය අනුව වැඩිම රැස්වීම් දීමනාව වූ රු. **12,500** ක් ඒ **(A)** ශ්‍රේණියේ රජය සතු ව්‍යාපාර සඳහා ගෙවනු ලබයි. එසේ තිබියදී, මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක නොකරන එෆ් **(F)** වර්ගයේ රාජ්‍ය ව්‍යවසායක් වූ සමාගම **2019** වර්ෂයේදී පවත්වන ලද රැස්වීම් **09** ක් සඳහා සහභාගි වූ එක් එක් අධ්‍යක්ෂ පණ්ඩල සාමාජිකයින් වෙත පැමිණීමේ දීමනාව රු.**25,000** ක් බැගින් රු.**1,225,000** ක් හා **2018** වර්ෂය තුළ රැස්වීම් **6** ක් පැවැත්වීම වෙනුවෙන් රු. **650,000** ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. | සභාපතිවරයාගේ මාසික දීමනා සහ සමාගම අධ්‍යක්‍ෂක මණ්ඩල රැස්වීම් සඳහා දීමනා අධ්‍යකෂක මණ්ඩල අනුමැතිය සහිතව ගෙවා ඇත. | විධිමත් අනුමැතියකින් තොරව ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු වීම. |

**1.8** බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය රු.**5,037,187** ක් වූ අතර රඳවා ගැනීම් බදුවලින් රු.**3,021,258** කට අදාල බදු සහතිකපත් විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ හේතුවෙන් ඉහත රඳවා ගැනීමේ බදු ශේෂය ආදායම් බදු ගෙවීමේදී අඩු කර ගැනීම පිළිබඳව අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි. | පැරණි වර්ෂ වල රඳවාගැනීමේ බදු සහතික බැංකුව විසින් ලබාදී නොමැත. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාකර අවසාන විසඳුමකට පැමිණිය යුතු වීම. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**128,503,752** ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු.**801,559,524** ක් විය. ඒ අනුව පාඩුව රු.**673,055,772** කින් අඩුවී තිබූ බව නිරීක්ෂණය විය. මෙලෙස තවදුරටත් පාඩුවක් පැවතීමට ශ්‍රී ලංකා රජය මගින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් කටයුතු **2017** නොවැම්බර් **13** දින අවසන් කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම් නොමැතිවීම සහ ණය මත පොළී වියදම් එකතුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2019 (රු) | 2018 (රු) |
|---|---|---|
| ආදායම | - | - |
| ඍජු වියදම් | - | (6,805,801) |
| පරිපාලන වියදම් | (7,191,239) | (41,722,417) |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | (7,191,239) | (48,528,218) |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | (148,185,664) | (194,055,646) |
| විදේශ විනිමය ලාභය/(අලාභය) | | (558,975,660) |
| | 26,873,152 | |
| බදු පෙර ශුද්ධ ලාභය | (128,503,752) | (801,559,524) |
| ආදායම් බදු | - | - |
| බදු පසු ශුද්ධ ලාභය | (128,503,752) | (801,559,524) |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**i.** සමාගමේ මෙහෙයුම් කටයුතු **2017** නොවැම්බර් **13** දින අවසන් කර තිබීම හේතුවෙන් **2018** හා **2019** වර්ෂයන් තුල මෙහෙයුම් කටයුතු වලින් සමාගමට ආදායම් ලැබී නොතිබුණි.

ii. **2018 වර්ෂයේ රු.558,975,660 ක් විදේශ විනිමය අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.26,873,152 ක විදේශ විනිමය ලාභයක් බවට පත්වී තිබුණි.**

**2.3. අනුපාත විශ්ලේෂණය**

| | 2019 | 2018 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1:3.29 | 1:3.23 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:3.32 | 1:3.27 |
| මෙහෙයුම් ලාභ අනුපාතය | - | - |

**2018 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1:3.23 සහ 1:3.27 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය පිළිවෙලින් 1:3.29 ක් සහ 1:3.32 ක් ලෙස වැඩි වී තිබුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී සමාගමේ සේවකයන් වන්දි ගෙවා ඉවත් කිරීමේදී ඇති වූ ආරවුල් සහගත තත්වය කොළඹ කාර්මික අධිකරණයේ කාර්මික බේරුම්කරණ අංක.A/37/2017 දරන තීරණය සහ 2018 පෙබරවාරි 02 දින පාර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ කොන්දේසිවලට එකඟ වීම මත අවසන් කර තිබුණි. සමථ ගිවිසුමේ කොන්දේසි අංක 18 (ආ) අනුව 2017 නොවැම්බර් මාසය සඳහා හිඟ අතිකාල දීමනා සහ/හෝ 2018 ජනවාරි දක්වා හිඟ වැටුප් ගෙවිය යුතුව ඇත්නම්, එම ගෙවීම් 2018 පෙබරවාරි 28 වන දිනට පෙර ගෙවා නිම කළ යුතු බවට එකඟ වී තිබුණි. සමාගම විසින් එම එකග වූ කොන්දේසිවලට පටහැනිව සමාගමේ මෙහෙයුම් අක්‍රියව පැවති 2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි මාසයන්ට අදාලව ගමන් වියදම්, නවාතැන් දීමනා, කාර්යසාධන දීමනා හා වාහන දීමනා ලෙස රු.12,211,073 ක් වූ වෙනත් දීමනාවන් සේවකයන් වෙත ගෙවා තිබුණි. මේ පිළිබඳව 2017 සහ 2018 වර්ෂවල විගණන වාර්තා මගින් ද පෙන්වා තිබු නමුත් අදාල කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවීම් සඳහා වගකිව යුතු පාර්ශ්වයන් හඳුනාගෙන අයකර ගැනීම | සමථ මණ්ඩල සාකච්චා වලට සහභාගීවී ඇත්තේ එවකට සමාගමේ කළමනාකාරීත්වයයි. එම සමථ කොන්දේසි වල 18 "අ" සහ "ආ" යටතේ සේවකයන්ගේ හිඟ සිටින ලද වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එකඟ වූ කොන්දේසි දක්වා ඇත. එම කොන්දේසි එකඟවූ පදනම පහත පරිදි වේ . 2017 නොවැම්බර් මාසයේ 29 වන දින සියළුම සේවකයන් වෙත පරිශ්‍රයෙන් ඉවත් වන ලෙස දැනුම් දෙන ලදී.<br>ඒ වන විට නොවැම්බර් මාසයේ එතෙක් වැඩ කල කාලසීමාවට අදාළව අතිකාල දීමනා සහ වැටුප් ගෙවීම සිදු නොකර තිබු බැවින් විශේෂයෙන්ම නොවැම්බර් මාසය සඳහා ඇතිකාල දීමනා ගෙවන ලෙස එකඟ වී ඇත . එමෙන්ම බහුතරයක් සේවකයන්ගේ 97% පමණම මූලික වැටුප රු .12,000 - 20,000 අතර පැවතිනි. එබැවින් කාර්යසාධන දීමනාව සෑම සේවකයෙක් වෙතම ස්ථිර දීමනාවක් ලෙස සමාගම විසින් ආරම්භයේ සිටම ගෙවා තිබුණි.<br><br>තවද, ඉන්ධන, ප්‍රවාහන, නවාතැන් දීමනා ආදිය ගෙවනු ලැබුවේ සමාගමේ මධ්‍යම සහ ඉහළ කළමණාකාරීත්වයේ සේවකයන් 07 දෙනෙක් සඳහා පමණි . එම සේවකයන් වෙත සමාගමේ අවශේෂ කටයුතු පවත්වාගෙන යාම සඳහා දිගටම සේවයේ | වන්දි මුදල් ගෙවීමේදී සමථ කොන්දේසි අනුව කටයුතු කල යුතුය. එම කොන්දේසිවල පටහැනිව යම් ගෙවීමක් සිදු කර ඇත්නම් අදාල ගෙවීම්වලට වගකිවයුතු නිලධාරීන්ගෙන් ඒවා ආපසු අය කර ගැනිමට කළමනාකරණය ක්‍රියාකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා කළමනාකරණය සහ වගකිවයුතු පාර්ශවයන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිරතවන ලෙස උපදෙස් ලබා දී තිබුණි. සේවකයන් 360 කට වඩා සේවය කල සමාගමක් එක් වරම ව්‍යාපාර කටයුතු නතර කලද සේවකයන් ඉවත් කිරීම , වන්දි මුදල් සාකච්චා කිරීම, වත්කම් පැවරීම, ලියවිලි ඉවත් කරගැනීම ආදී කටයුතු සඳහා ආයතනය නියෝජනය කරමින් සේවකයින් සිටිය යුතුය. එම සේවකයින් 2018.01.31 දක්වාම සිය සේවය පෙර පරිදි ම ආයතනය වෙත ලබා දෙන ලද බැවින් ඔවුන්ගේ සියළු වැටුප් ගෙවිය යුතුය. | |
| (ආ) | ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් තුල ගෙවීම් වවුචර් සියල්ල අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්ෂා සහිතව තබා ගත යුතුය. එසේම සියළුම වවුචර් විගණනය සඳහා සම්පූර්ණ කර සුදානම් කර තැබීමට වවුචර් භාර නිලධාරියා වගබලා ගත යුතු වුවද මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් 2017 වර්ෂයට අදාළ රු. 29,975,094 ක වටිනාකමින් යුත් ගෙවීම් වවුචර් 104 ක් සහ 2018 වර්ෂයට අදාල රු. 4,543,395 ක වටිනාකමින් යුත් ගෙවීම් වවුචර් 19 ක් 2021 මාර්තු 15 දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | 2018 වර්ෂයේ ලියවිලි හැකි ඉක්මණින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම 2018 වර්ෂයේ ලියවිලි ස්ථාන මාරු කිරීමකදී අස්ථාන ගතවී ඇති බව උපකල්පනය කෙරේ. කෙසේ වුවද එම ලිය කියවිලි සොයා බලා ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන අතර බැංකුව වෙතින් එම ගෙවීම් වලට අදාළ චෙක්පත්වල පිටපත් ලබා ගැනීමට ලිඛිතව සන්නිවේදනය කරන ලදී. | සමාගමේ ලිපි ලේඛණ හා වත්කම් පරිශ්‍රයෙන් ඉවත්වීමේදී විධිමත්ව හා ක්‍රමානුකූලව සිදු කර නොමැති හෙයින් ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |